| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 0112669192 , 0112675011<br>) 0112694033, 0112675280<br>) 0112675449 | මගේ අංකය<br>எனது இல<br>My No. | )MH/TA/02/RG/TRA/4/2025<br>)<br>) |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 0112693866<br>) 0112693869<br>)0112692913 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | )<br>)<br>) |
| විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | )postmaster@health.gov.lk<br>)<br>) | දිනය<br>திகதி<br>Date | )<br>)2025. 12. 10<br>) |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>website | ) www.health.gov.lk<br>)<br>) | | |

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA


# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු/ සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,
සියළුම රෝහල් අධ්‍යක්ෂවරු/ වෛද්‍ය අධිකාරිවරු/ සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්,

**<u>ස්ථානමාරු මණ්ඩලය පැවැත්වීම - විකිරණ ශිල්පී 2025</u>**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ විකිරණ ශිල්පී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු මණ්ඩලය පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව, ස්ථානමාරු අයදුම් කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්හට ස්ථානමාරු අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර (ආයතන ප්‍රධානියාගේ නම සහිත නිල මුද්‍රාව යොදා) 2025.12.31 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට හා ෆැක්ස් අංකවලට යොමු කරන ලෙසට සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙසට මෙයින් දන්වමි.

| | |
|---|---|
| අතිරේක ලේකම් (පාලන) II | ෆැක්ස් අංකය :- 0112678169 |
| සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, | දුරකථන අංකය :- 0112678169 |
| 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, | දිගුව :- 319/323 |
| කොළඹ 10. | විද්‍යුත් තැපැල :- mohtagov@gmail.com |

03. එමෙන්ම, පළාත් සභා සඳහා ස්ථානමාරු අයදුම් කරන නිලධාරීන්ට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක WPC/PSC/TRF5/B/2021/121 හා 2022.03.14 දිනැති ලිපියෙ හි දක්වා ඇති පිරික්සුම් ලැයිස්තුවට (ඇමුණුම 01) අවධානය යොමු කර ස්ථානමාරු අයදුම්පත් යොමු කරන ලෙස දන්වා සිටිමි.

04. පළාත් රාජ්‍ය සේවයේ සිට රේඛිය අමාත්‍යාංශය වෙත ස්ථානමාරු ඉල්ලුම් කරන නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2020 (I)හා 2024.07.24 දිනැති චක්‍රලේඛයේ 02 වන පරිච්ඡේදයේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

05. තවද, 2024 වර්ෂයේ යොමු කරන ලද අයදුම්පත් අතුරින් "ස්ථානමාරු මණ්ඩලය - විකිරණ ශිල්පී 2025" සඳහා ද සලකා බැලීමට අවශ්‍ය අයදුම්පත් පවතිනම් ඒ බව නිලධාරියාගෙන් ලබාගත් ලිපියකින් තහවුරු කරන ලෙසත් දන්වමි.

එල්.එස්. මාගම්මුල්ල
අධ්‍යක්ෂ (පාලන) 02
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ - 10

එල්. එස්. මාගම්මුල්ල,
අධ්‍යක්ෂ (පාලන) 02.

අත්. කලෙ/චාමික එච්. ගමගේ,
අතිරේක ලේකම් (පාලන) II.

# පිරික්සුම් ලැයිස්තුව

ස්ථාන මාරු අයදුම්පත සමග මෙම පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කර අමුණා එවීම අනිවාර්යය වේ.

| ස්ථාන මාරුවීම් යටතේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට ස්ථාන මාරුවී පැමිණීමේදී ලබා දිය යුතු ලියවිලි | | | |
|---|---|---|---|
| | අවශ්‍ය ලේඛණ | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු පිටපත් සංඛ්‍යාව | ඇමුණුම ඇත/නැත |
| 1. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/91 යටතේ වන ස්ථාන මාරු අයදුම්පත | මුල් පිටපත හා ඡායා පිටපතක් | |
| 2. | විධිමත් පත්වීම් ලිපිය | සහතික කළ පිටපත් දෙකක් | |
| 3. | සේවය ස්ථිර කිරීමේ ලිපිය | සහතික කළ පිටපත | |
| 4. | ජාතික හැඳුනුම්පත | සහතික කළ පිටපත | |
| 5. | ▪ සේවය ස්ථිර කර නොමැති නම්, බස්නාහිර පළාත් රජාය සේවයට අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බව සනාථ කරන අධ්‍යාපන සහතිකවල **විභාග කොමසාරිස් ජනරාල් විසින්/ විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී විසින් සනාථ කරන ලද පහත සඳහන් ලියවිලි**<br>▪ අ.පො.ස.(සා.පෙ.) හා අ.පො.ස.(උ.පෙ.) විභාග ප්‍රතිඵල සටහන්<br>▪ උපාධි සහතිකය / විද්‍යාපීඨ සහතිකය / පුහුණු සහතිකය / ඩිප්ලෝමා සහතිකය සනාථ කිරීමේ ලිපියේ පිටපතක්<br>▪ වැඩ භාර ගැනීමේ ලිපියේ පිටපතක් | සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය | |
| 6. | බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය සහිත බව තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (DS 04) | මුල් පිටපත | |
| 7. | නිලධාරියා දැනට දරණ ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල ලේඛන | සහතික කරන ලද පිටපත | |
| 8. | දැනට සේවයේ නියුතු විදුහල්පතිවරුන් විසින් නිකුත් කරන ලද විධිමත් ඉගැන්වීම් කාලසටහන (ශ්‍රී ලංකා ගුරු සේවයේ අයදුම්කරුවන්ට පමණි) | සහතික කරන ලද පිටපත | |
| 9. | ස්ථාන මාරුව ලබා ගැනීමෙන් පසු බස්නාහිර පළාත් සභාව තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන බවට හා බස්නාහිර පළාතේ ඕනෑම සේවා | මුල් පිටපත | |

| | | | |
|---|---|---|---|
| | ස්ථානයක සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශිත ලිපිය. | | |
| 10. | පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධරයන් අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛණයේ නියමිත ස්ථානයේ තැබීමේ කොන්දේසියට යටත්ව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළකල ලිපිය | මුල් පිටපත | |
| 11. | ස්ථාන මාරු අයදුම් කරන දිනට පූර්වාසන්න වසර 03 ක (පවත්නා වර්ෂයද ඇතුළත්ව) වැටුප් රහිත නිවාඩු ඇති / නැති බවට වාර්තාවක් (ආයතන ප්‍රධානී නිර්දේශ සහිතව) | මුල් පිටපත | |
| 12. | නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇති/ආරම්භ කිරීමට සූදානම්ව ඇති / නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී ගේ සහතිකය (මෙහි විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට සූදානම්ව ඇතැයි යන්නෙන් අදහස් කෙරෙනුයේ සිද්ධියට අදාළ මූලික පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව/ඒ පිළිබඳව නිලධාරයාගෙන් නිදහසට කරුණු විමසා තිබීම යන්න වේ.) | මුල් පිටපත | |
| 13. | අදාළ පළාත් සභාවේ සේවා කාලය තුළදී ඊට අදාළ වන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධාරියාට එරෙහිව නොපවතින බවට ආයතන ප්‍රධානි නිර්දේශය සහිත වාර්තාව. | මුල් පිටපත | |
| 14. | නිලධාරියා සම්බන්ධයෙන් බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති /නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී සහතිකය. | මුල් පිටපත | |
| 15. | අදාළ නිලධාරියා දැනට සේවයේ නියුතු පළාත් සභාවේ වියදමෙන් විශේෂ පුහුණුවක් ලබා තිබේ නම්, පුහුණුවට අදාළ ගිවිසුම්ගත අනිවාර්යය සේවා කාලය ඉකුත්වී තිබීම හෝ කිසියම් බැඳුම්කරයක යටත්කොට තිබී බැඳුම්කරයෙන් නිදහස් වී ඇති/නැති බවට ආයතන ප්‍රධානියා ගේ වාර්තාව. | මුල් පිටපත | |
| 16. | ස්ථාන මාරු අයදුම්කරුගෙන් අදාළ පළාත් සභාවට/රජයට අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳ අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන වාර්තාව (අයදුම්කරු විසින් WPC/PSC/R/FO/01 ආකෘතියේ මුල් කොටස සම්පූර්ණ කර මෙම වාර්තාවට අමුණා එවිය යුතුය.) | මුල් පිටපත | |